**තංගල්ල නගර සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
**-------------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 23 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

මෙම වාර්තාවේ **1.3** ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට තංගල්ල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**---------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

පහත විස්තර දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදි නිරීක්ෂණය විය.

(අ) 2015 වර්ෂයට අදාළ මුද්දර ගාස්තු ආදායම ගැලපීම් කිරීමේදී රු. 2,026,724 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) නගර සභා කාර්යාල පරිශ්‍රයේ බුදු මැදුරක් සකස් කිරීම සඳහා දරා තිබූ රු. 160,000 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ ඉන්ධන වියදම් සඳහා රු. 33,300 ක් වැඩියෙන් ණයහිමි ප්‍රතිපාදන ඇති කර තිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**
**---------------------------**

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් මුද්දර ගාස්තු ශේෂය සහ මුද්දර ගාස්තු ලේඛනයෙහි දැක්වෙන ශේෂය අතර රු. 3,120,419 ක අසමානතා නිරීක්ෂණය විය.

**1.3.3 ගෙවිය යුතු ගිණුම්**

1999 වසරේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කාල පරිච්ඡේදයට අදාළව පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු එකතුව රු. 3,915,839 ක දායක මුදල ගෙවීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.9,076,622 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| නගර සභා ආඥා පනත (255 වන අධිකාරිය) | |
| i. 72 (2) හා (3) වගන්ති | නව කඩ වීදියෙහි අංක 31 කඩකාමරය හා පොදු වැසිකිළියට මැදිව ඇති අනවසර ඉදිකිරීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| ii. 165 (ආ)(1අ) වගන්තිය | නගර සභා පරිපාලන සීමාව තුළ වෘත්තියේ යෙදෙන සෑම තැනැත්තෙකුගෙන්ම බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| iii. 227 (1) වගන්තිය | නගර සභාවක කිසියම් සභිකයෙකු, නිලධාරියෙකු හෝ සේවකයෙකු විසින් සභාව සමඟ ගිවිසුම් සම්බන්ධතා නොදැක්විය යුතු වුවත්, තංගල්ල බස් නැවතුම්පොල අංක 01 කඩ කාමරය බදු දීමේදී ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |

**1.3.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

නාගරික කොමසාරිස්වරු හා නගර සභා සභාපතිවරුන් අමතන ලද පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශ ලේකම්ගේ, 1982 ජූලි 27 දිනැති අංක : එල්ජී/ඩී/26/13 දරන ලිපිය අනුව පළාත් පාලන ආයතනවලට අයත් තානායම්වල, ගොඩනැගිලි හා ගෘහ භාණ්ඩ අළුත්වැඩියා කිරීමේ වියදම බදුකරු විසින් දැරියයුතු වුවද තානායම් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් දරා තිබූ වියදමින් රු.1,050,000 ක් සභාවට අයවිය යුතු තානායම් කුලියෙන් කපා හැර තිබුණි.

**2.** **මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,988,438 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 10,419,278 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

---

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

---

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුග තආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i | වරිපනම් හා බදු | 3,100,000 | 3,075,996 | 3,426,540 | 394,406 | 2,900,000 | 2,791,190 | 3,935,843 | 966,145 |
| ii | කුලී | 11,777,100 | 10,292,685 | 5,249,302 | 321,606 | 9,418,000 | 8,420,829 | 7,882,296 | 3,080,300 |
| iii | බලපත්‍ර ගාස්තු | 1,249,000 | 816,672 | 815,642 | - | 677,000 | 1,055,027 | 1,065,027 | - |
| iv | වෙනත් ආදායම් | 19,311,500 | 15,342,565 | 11,138,603 | 14,457,168 | 18,283,800 | 10,746,076 | 7,827,313 | 8,018,250 |
| | එකතුව | 35,437,600 | 29,527,918 | 20,630,087 | 15,173,180 | 31,278,800 | 23,013,122 | 20,710,479 | 12,064,695 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ බිල්කළ ආදායම රු. 29,527,918 ක් වූ අතර, ඉන් රු. 20,630,087 ක් රැස්කර තිබුණි. ඉකුත් වර්ෂය අවසානයට රු. 12,064,695 ක් වූ මුළු හිඟය සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු. 15,173,180 ක් දක්වා වර්ධනය වී තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

සමාලෝචිත වර්ෂය අවසානයට රු. 394,406 ක් වූ හිඟ ශේෂය අයකර ගැනීමට නගර සභා ආඥා පනතේ 170 (අ) ප්‍රකාරව කටයුතුකර නොතිබුණු අතර, එම හිඟය තුළ රු. 1,000 ට වැඩි වරිපනම් ඒකක 73 කින් අයවිය යුතු රු. 288,642 ක මුදලක් ඇතුළත්ව තිබුණි.

### 2.2.4 කුලී

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) කඩ කාමර 25 කින් 2017 දෙසැම්බර් 31 දිනට රු. 167,706 ක මුදලක් අයවීමට තිබුණු අතර, එම මුදල් අයකර ගැනීම සඳහා නගර සභා ආඥා පනතේ 170(අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) කඩ කාමර 143 කට අදාළව 2016 පෙබරවාරි 23 දිනැති අංක හම්/කුපු/804 දරන තක්සේරු වාර්තාව මගින් සංශෝධනය කර තිබූ මාසික කුලිය අය කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඇ) 2010 දෙසැම්බර් 27 දිනැති හා දපපා/පපාකො/2010/01 අංක දරන දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 05 වන ඡේදයට අනුකූලව සෑම ගිවිසුමක්ම වසර තුනකට වරක් යාවත්කාලීන කළ යුතු වුවත්, කඩ කාමර 42 කට අදාළ ගිවිසුම් වසර 07 සිට වසර 32 දක්වා කාලයක සිට යාවත්කාලීන කර නොතිබුණි.

(ඈ) ඉහත (ඇ) ඡේදයෙහි දැක්වෙන චක්‍රලේඛයේ 11 ඡේදයට අනුව සභාවේ අනුමැතියකින් තොරව වෙනත් පාර්ශවකරුවකු වෙත බදු අයිතිය පැවරීම කිසිසේත් නොකළ යුතු වුවත්, එම විධිවිධාන වලට පටහැනිව මාසිකව රු. 4,500 සිට රු. 20,000 දක්වා පරාසයක කුලී මුදල් අයකරමින් සභාවේ කඩ කාමර 08 ක් අතුරු බදු දී ඇති බව 2018 ජනවාරි මස 15 දින සිදු කළ ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ඉටු නොකළ කර්තව්‍යන්

----------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන සලසා ගෙන ඉටු කිරීමට යෝජිතව තිබූ එකතුව රු. 8,250,000 ක් වූ සංවර්ධන යෝජනා 09 ක් ඉටු කර නොතිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

පරිසර ආරක්ෂණ බලපත්‍රයේ සඳහන් නියමයන් හා කොන්දේසි අනුව ප්‍රමාණවත් ගිනි නිවීමේ උපකරණ හා පහසුකම්, ක්‍රියාවලිය පවත්වාගෙන යනු ලබන භූමිය තුළ ස්ථාපිත කර නොතිබුණි. තවද කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා යොදාගත නොහැකි ඝන අපද්‍රව්‍ය විවෘත භූමියකට බැහැර කිරීම සිදු කර තිබූ නමුත්, ඒ මත පස් තට්ටුවක් දමා වැසීම සිදු කර නොතිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

-----------------------------

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**----------------------------------**

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති අංක වීඊ/01/01 දරන චක්‍රලේඛයට අනුකූලව කටයුතු නොකිරීම නිසා 2017 වර්ෂය අවසාන වන විට නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථාපනය කර තිබූ වීථි පහන් 927 න් වීථි පහන් 293 ක් සඳහා පමණක් ගාස්තු ප්‍රතිපූර්ණය කර තිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු 05 ක 13 දෙනෙකුගේ අතිරික්තයක් සහ තනතුරු 17 ක 31 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට මෙන්ම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) දීර්ඝ කාලයක සිට සේවය අතහැර ගිය හා මියගිය සේවකයින් 17 දෙනෙකුගෙන් සභාවට අයවිය යුතුව පවතින එකතුව රු. 88,856 ක් වූ සේවක ණය අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

**3.4. මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

i. තංගල්ල සති පොළට යාබදව ඉදිකර තිබූ කඩ කාමර 27 කින් යුක්ත මෙම සංකීර්ණය 2007 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා බදු දී තිබුණු අතර, මෙම කඩ කාමරවලින් 12 ක් නව කඩ වීදියේ කඩ හිමියන් සඳහා ලබා දී හිමිකම අත්හරවා නැවත සභාව වෙත පවරා ගෙන තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම කඩ කාමර වෙනත් පාර්ශවයන් වෙත බදු දීමට කටයුතු කර නොතිබුණි.

ii. මෙම කඩ කාමර සඳහා බිල් නොකළද, කඩ කාමර 05 ක් පොළ පැවැත්වෙන දිනයන්හිදී විවෘත කර තබන බව 2018 ජනවාරි මස 15 දින සිදු කළ ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

iii. බදු දී තිබුණු මාසික කුලී අයකර නොගත්, කඩ කාමර සහ බදුදී නොතිබුණු කඩ කාමර සඳහා 2016 වර්ෂයේ සිදු කළ තක්සේරුවට අනුව, 2017 වර්ෂයේදී නගර සභාවට අහිමි වී ඇති ආදායම රු. 409,200 ක් විය.

**3.5. වත්කම් කළමනාකරණය**

**3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

ගිනි හා ආපදා කළමණාකරණ ඒකකයේ උපකරණ කට්ටල (Tool kit Set) 03 ක් බාහිර පාර්ශවයක් විසින් රැගෙන ගොස් වසර 03 කට අධික කාලයක් ගත වී ඇතත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම උපකරන නැවත සභාවට ලබා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

**3.5.2 පවරා නොගත් වත්කම්**

2016 වර්ෂයේ ස්ථාවර වත්කම් සමීක්ෂණයේදී හඳුනාගෙන තිබූ ඉඩම් හා ගොඩනැගිලි 25 ක නීත්‍යානුකූල අයිතිය 2018 ජනවාරි මස 15 දින වන විටත් නගර සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.5.3 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ**

(අ) වර්ෂ කිහිපයක සිට ඌනතා ලෙස හඳුනාගෙන තිබුණු භාණ්ඩ අයිතම 05 ක් සම්බන්ධයෙන් වූ නිර්දේශ, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, වර්ෂ කිහිපයක සිට ඌනතා ලෙස හඳුනාගෙන තිබී, නැවත සභාවට ලැබී තිබුණු බහු කාර්ය ජංගම කුටි 05 ට අදාළ ඉහළ ආවරණයන් ප්‍රයෝජනයට ගත නොහැකි ලෙස විනාශ වී තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) 2016 වර්ෂයේ ස්ථාවර වත්කම් සමීක්ෂණ වාර්තාවේ සඳහන් නිර්දේශ 05 ක් 2018 ජනවාරි 15 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.5.4 වාහන උපයෝජනය**

(අ) වාහනවල අයිතිය පවරා ගැනීම

සභාව විසින් භාවිතා කරන මධ්‍යම පරිසර අධිකාරියට අයත් ට්‍රැක්ටර් රථයේ ලියාපදිංචි අයිතිය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සභාව වෙත පවරා ගෙන නොතිබුණි.

(ආ) සභාවට අයත් වාහන 04 ක් මයිලෝ මීටරය/පැය මීටරය අක්‍රියව තිබියදී මාස 06 සිට මාස 72 ක් අතර කාලයක් තුළ ධාවනයේ යොදවා තිබුණි.

**3.6 ප්‍රසම්පාදනය**

**3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

**3.6.2 කොන්ත්‍රාත් පරිපාලනය**

2017 වර්ෂයේ සභා අරමුදල් යටතේ සතිපොළ ඉදිරිපිට කාණුව සඳහා කොන්ක්‍රීට් තහඩු යෙදීමේ කර්මාන්තය වෙනුවෙන් සියයට 10 රැඳවුම් මුදල අඩු කළ පසු රු. 283,288 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවීම සඳහා ලියන ලද අංක 132884 දරන චෙක්පත 2018 ජනවාරි 16 දින වන විටත් අත රඳවාගෙන තිබුණි. යොදවා තිබූ කොන්ක්‍රීට් තහඩු වලට යොදන ලද කොන්ක්‍රීට් මිශ්‍රණය ඉතා දුර්වල මට්ටමක පැවති බව නිරීක්ෂණය වූ අතර, 2018 ජනවාරි 15 දින වන විටත් කොන්ක්‍රීට් තහඩු 05 ක් භාවිතයට ගත නොහැකි ලෙස පුපුරා ගොස් තිබුණි. මෙම තත්ත්වය විගණනය විසින් පෙන්වා දුන් පසු, කොන්ක්‍රීට් තහඩු 05 ක් තත්ත්ව පරීක්ෂාවට ලක් කර තිබූ අතර, පරීක්ෂණාගාර ප්‍රතිඵල අනුව කොන්ක්‍රීට් තහඩුවල ශක්තිය 20($N/nm^2$) තත්ත්වයේ පැවතිය යුතු වුවත්, ඒවායේ ශක්තිය 9 සිට 15 ($N/nm^2$) අතර මට්ටමක පැවතුණි. ඒ අනුව පරීක්ෂාවට ලක් කළ සියලු තහඩු නිසි ප්‍රමිතියෙන් තොර විය.

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය.

(අ) ආදායම් විෂයයන් 05 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු. 34,580,969 ක් වූ අතර, එම අගයයන් සියයට 13 සිට සියයට 78 ක් දක්වා පරාසයක විය.

(ආ) සැපයුම් හා උපකරණ වැය විෂයයෙහි අහිතකර විචලනය රු. 801,876 ක් වූ අතර, එම අගය සියයට 17 ක් විය.

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂිකව විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා කමිටු රැස්වීම් 3 ක් පමණක් පවත්වා තිබුණි.

**5. පද්ධති හා පාලන**

**------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| **පද්ධතිය** | **අඩුපාඩුව** |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | i. මූල්‍ය ප්‍රකාශනවල සහ උපයෝගී ලේඛනවල දැක්වුණු වටිනාකම් අතර වෙනස්කම් පැවතීම. |
| | ii. ගිණුම් ශේෂ වැඩියෙන් දක්වන ලද අවස්ථා පැවතීම. |
| | iii. ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත නොකරන ලද අවස්ථා පැවතීම. |
| (ආ) ආදායම් පරිපාලනය | i. හිඟ ආදායම් අයකර නොගැනීම. |
| | ii. කඩ කාමර ගිවිසුම් විධිමත්ව යාවත්කාලීන නොකිරීම. |
| | iii. නව තක්සේරු මත කඩ කුලී අය නොකිරීම. |
| | iv. අවසරකින් තොරව කඩ කාමර අතුරු බදු දී ඇති අවස්ථා පැවතීම. |
| (ඇ) සේවක කළමනාකරණය | අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට හා පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) අයවැය පාලනය | i. අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් පැවතීම. |
| | ii. අයවැයගත සහ තථ්‍ය ආදායම් ඉලක්ක සම්පූර්ණ කර නොගැනීම. |